**ප්‍රාදේශීය සංවර්ධන සහය ව්‍යාපෘතිය - 2019**

**--------------------------------------------------------------**

ප්‍රාදේශීය සංවර්ධන සහය ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2019 මැයි 14 දින එලඹි අංක 6371 - එල්කේ දරන ණය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රජාවන්ට ප්‍රතිචාරාත්මකව හා වගවීමකින් යුතුව සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සහභාගී වන පළාත්වලට සහය වීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 17,665.63 කට සමාන එජඩො මිලියන 100.65 ක් වන අතර ඉන් රු.මිලියන 12,222.41 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණු අතර රු.මිලියන 4,220.98 කට සමාන එජඩො මිලියන 23.65 ක් මූල්‍යායනය කිරීම යුරෝපා සංගමය එකඟවී තිබුණි. ඉතිරි මුදල වන එජඩො මිලියන 7 මූල්‍යනය කිරීම ශ්‍රී ලංකා රජය අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 30 දින ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමණාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති 2019/1 දරන කළමණාකරන සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති සමාලෝචන කමිටු මාස 2කට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් | ව්‍යාපෘතියේ නියාමන කටයුතු කාර්යක්ෂමව ඉටු නොවීමට | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉඩ ඇත. | | අවශ්‍යා වේ. |
| (ආ) | ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි 137 සහ 138 | රු. මිලියන 5.16 ක අත්තිකාරම් උපකාරක ලියවිලි නොමැතිව නිරවුල් කර තිබුණි. | වංචාවක් සිදුකිරීමට ඇති හැකියාව වැඩිවේ. | වියදම් වාර්තාව පදනම් කර ගනිමින් අත්තිකාරම නිරවුල් කර තිබුණි. | වවුචරය සමඟ සියළුම උප ලේඛණ ඇමිණීමට පියවර ගත යුතුය |

3. **භෞතික කාර්යසාධනය**

3.1 **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| විගණන ගැටළුව | | බලපෑම | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව ව්‍යාපෘතිය පළාත් 4 ක පළාත් සේවා සේවා සැපයීම සහ ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට සහයෝගය දැක්වීම සිදු කළ යුතුය. කෙසේවෙතත් උප ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබාගැනීමකින් තොරව පළාත් සභා 4 කට රු. මිලියන 268.98 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත් 2020 ජුලි 15 දක්වා උප ව්‍යාපෘතින් ආරම්භ කර නොතිබුණි. | (අ)<br>(ආ)<br>(ඇ) | සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයක් සිදුවේ.<br>පිරිවැය ඉක්මවා යෑම<br>අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරෙත්තුවන ප්‍රතිලාභ නොලැබීම. | සම්පූර්ණ අනුමැතිය මත උප අග්‍රිමය නිදහස් කර තිබුණි. | ව්‍යාපෘති විසින් උප ව්‍යාපෘතින් අනුමත කිරීමට සහ උප ව්‍යාපෘතින් ආරම්භ කිරීමට පළාත් පාලන ආයතන උනන්දු කිරීම පියවර ගැනීමට අවශ්‍යවේ. |

3.2 **ව්‍යාපෘති කළමණාකරණ ඒකකය පිහිටුවීමට අදාල ගැටළු**

| විගණන ගැටළුව | | බලපෑම | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| සම්පූර්ණ කාලය සේවයේ නියතු අධ්‍යක්ෂකවරයෙකු සහ සම්පූර්ණ කාර්ය මණ්ඩලය සහිතව ව්‍යාපෘති කළමණාකරණ ඒකකය ස්ථාපිත කර නොතිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘතිය සැලසුම් අදියරේ අර්ධ කාලීන පදනමට බඳවාගත් කාර්ය මණ්ඩලයම අර්ධ කාලීන පදනම මත මෙම ව්‍යාපෘතිය අනුයුක්ත කර තිබුණි. | (අ)<br>(ආ)<br>(ඇ) | කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවේ. ඇස්තමේන්තුගත<br>පිරිවැය ඉක්මවා යෑම.<br>අපේක්ෂිත පාර්ශවයන්ට බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබීම. | ජනාධිපතිවරණය සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හේතුවෙන් පත්වීම් ලබාදීම සිදුකල නොහැකි වේ. | හැකි විගස කැප වූ ව්‍යාපෘති කළමණාකරණ ඒකකයක් පිහිටුවීමට හා පූර්ණ කාලීන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයක් පත් කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 පද්ධති හා පාලනයන්

| | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරණයේ ප්‍රතිචාර | විගණනයේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමේ උප ලේඛණ 02 හි (ඇ) ව්‍යවස්ථාව අනුව පළාත් සභා 04 සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පළාත් සභාවල නිළධාරීන් මෙම ව්‍යාපෘතියේ වගකීම් පැහැර හැරිනු ඇත. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව පළාත් සභා සමඟ ගිවිසුම් අත්සන් කරනු ලැබේ. | ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර දරන ලද රු.මිලියන 1.7 ක වියදම ව්‍යාපෘතියේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යෑම සිදුවේ. | අදහස් දක්වා නොමැත | රු. මිලියන 1.7 ක මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කළමණාකරණ ඒකකයට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක වලට ගණකාධිකාරිවරුන් පස් දෙනෙකු බඳවාගෙන තිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘතිය සඳහා ගිණුම්කරණ පද්ධතියක් නිර්මාණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ බව නොපෙන්වයි. | ගිණුම්කරණ පද්ධතිය හා අත්පොත් පිළියෙල කර තිබුණි. අනාගතයේදී එය හඳුන්වා දෙනු ලැබේ. | ගිණුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබාගැනීමට 2019 වසර සඳහා වාර්ෂික අයවැය සහ වැඩ සැලැස්ම සම්පූර්ණ කර නොතිබුණි. | කාලීනව ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම නොහැකි අතර අවධානය අඩු වීම. | ව්‍යාපෘති සමාලෝචන කමිටුවට වෙත වැඩ සැලැස්ම සහ අයවැය ඉදිරිපත්කර තිබුණි. | අයවැය සහ වැඩ සැලැස්ම පිළියෙල කර සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය |